(03) 00250

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව -6 මට්ටම

අවසාන පරීක්ෂණය -2017/2018

LWU4324/LLU6716 -වාණිජ නීතිය

කාලය - පැය 3 යි

---

දිනය - 2020 මාර්තු 01 වේලාව- ප.ව 1.30 - ප.ව.4.30

---

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

සියලුම ප්‍රශ්න ගණන 08.

ප්‍රශ්න <u>පහකට(05)</u> පමණක් පිළිතුරු සපයන්න.

01. අ) 1896 අංක 11 දරන භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් සහ විකිණීමට එකඟ වීමේ ගිවිසුමක් අතර ඇති වෙනස කුමක්ද?

අදාළ නෛතික ප්‍රතිපාදන සහ උදාහරණ ඇසුරින් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 06)

ආ) "පනතේ (එක්සත් රාජධානියේ භාණ්ඩ විකිණීමේ පනතේ) සඳහන් මූලික රීතිවල සාමූහික බලපෑම වන්නේ ගුණත්වය හෝ අරමුණට යෝග්‍ය වීම සම්බන්ධයෙන් භාණ්ඩවලට ඇති අවදානමට එරෙහිව සැළකිය යුතු මට්ටමෙන් ආරක්ෂාවක් ගැණුම්කරුට ලබා දීමයි. ඇත්තෙන්ම අද වන විට, විකිණුම්කරු ආරක්ෂා විය යුතුය යන්නට (*caveat venditor*) වඩා ගැණුම්කරු ආරක්ෂා විය යුතුය යන්න(*caveat emptor)* නීතියේ මූලික මූලධර්මය ලෙස සැළකීම යථාර්ථවාදී නොවේ."

Adams J.N., MacQueen H(2010) *Atiyah's Sale of Goods*(12th Ed),p.140

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද?

ඉහත ප්‍රකාශය ඇසුරෙන් ශ්‍රී ලංකාවේ භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ව්‍යංග කොන්දේසි සහ ව්‍යංග ප්‍රතිඥාභාරවල විෂය පථය සහ අදාළත්වය සම්බන්ධව සාකච්ඡා කරන්න.

(ලකුණු 14)

2. අ) සුපුන්, රු. 450,000/- ලෙස මිල ලකුණු කරන ලද මෝටර් බයිසිකලයක් මිලට ගැනීම සඳහා 2019. 07. 01 දින බයික්ලැන්ඩ් සමාගම සමඟ කුලී සින්නක්කර ගිවිසුමකට එළඹුණේය. ඔහු, රු. 50,000/- ගෙවූ අතර ඉතිරි කුලී සින්නකර මිල මාසික වාරික 24 කින් ගෙවීමට එකඟ වූයේය. තවද, සෑම මාසයකම 30 වන දින හෝ ඊට පෙර මාසික වාරිකය ගෙවීමට සුපුන් එකඟ වූයේය. සුපුන් වාරික 3ක් නියමිත කාලයට ගෙවූ නමුත්, මූල්‍යමය දුෂ්කරතාවලට මුහුණදීමට සිදුවූ නිසා හතරවන වාරිකය ගෙවීමට අපොහොසත් වූයේය. බයික්ලැන්ඩ් සමාගම 2019.11.07 වන දිනැති ලිපිය මඟින් වහාම මාසික වාරිකය ගෙවන ලෙස සුපුන්ට දැනුම් දුන්නේය. ගෙවීම පැහැර හරින ඕනෑම විටකදී, හිඟ මුදල පියවා ගැනීම සඳහා ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාගම පෙළඹෙන බව ඔහුට තවදුරටත් දන්වන ලදී. සුපුන් වෙතට ලිපිය ලැබී දින 3කට පසුව, බයික්ලැන්ඩ් සමාගමේ උපදෙස් මත මැර පිරිසක් විසින් මෝටර් බයිසිකලයට සැළකිය යුතු මට්ටමෙන් හානියක් ඇති කරමින් එය අත් කර ගත්තේය.

ශ්‍රී ලංකාවේ කුලී සින්නක්කර ගිවිසුම් හා අදාළ නීතියට අනුකූලව බයික්ලැන්ඩ් සමාගම කටයුතු කර ඇත් දැයි දැන ගැනීමට සුපුන් අපේක්ෂා කරයි. සුපුන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 15)

ආ) කුලී සින්නක්කර මිලෙන් 75% කට වඩා සුපුන් ගෙවා තිබුණි නම් ඔබගේ පිළිතුර වෙනස් වන්නේද? කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

03. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය ඇසුරෙන් පහත සඳහන් අවස්ථාවල නෛතික තත්වය සාකච්ඡා කරන්න.

අ) මහින්ද, ශිරානිගේ වාසියට බිල්පතක් රේඛනය කළේය. නාමල් විසින් බිල්පත සොරා ගත් අතර ඔහු ශිරාණිගේ අත්සන ව්‍යාජ ලෙස යෙදුවේය. සද්භාවයෙන් යුතු වටිනාකමකට එය ලබා ගත් කමල් පසුව එය රෝහිතට ලබා දුන්නේය. (ලකුණු 06)

ආ) රනිල්, ණයක් ගෙවීම සඳහා සෙරන්ඩිබ් බැංකුවේ චෙක්පතක් රන්ජන්ගේ වාසියට රේඛනය කළේය. චෙක්පත රේඛනය කළ රන්ජන්, එය පිටසන් කර ලබා ගත් භාණ්ඩ වෙනුවෙන් මලික්ට ලබා දුන්නේය. මලික්, සීලැන්ඩ් බැංකුවේ ඇති ඔහුට අයත් ගිණුමේ එය තැන්පත් කළේය. සීලැන්ඩ් බැංකුව චෙක්පත සඳහා මුදල් රැස් කර ගත් නමුත්, වැරදීමකින් එය වෙනත් අයකගේ ගිණුමේ තැන්පත් කළේය.

(ලකුණු 08)

ඇ) විමල්, චම්පිකගේ වාසියට රු.10,000/ ක චෙක්පතක් රේඛනය කළේය. චම්පික එය රු.100,000/ ලෙස වෙනස් කර අනුරට ලබා දුන්නේය.

(ලකුණු 06)

4. රුක්මල්, ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ රජයේ පාසලක් අසළ ආපන ශාලාවක් පවත්වා ගෙන යයි. සොසේජ් බනිස්, මාලු බනිස්, රෝල්ස්, කට්ලට්, පැටිස් හා බෝතල් කරන ලද බීම (soft drinks)අඩු මිලකට විකුණන නිසා ආපනශාලාව ළමුන් අතරේ ප්‍රසිද්ධ වී ඇත. භාණ්ඩ ප්‍රදර්ශනයට තබන අල්මාරියේ මෙම ආහාර වර්ග දවටන නොමැතිව තබා ඇති අතර මැස්සන් සහ කුඩාකෘමින් වර්ග නිතරම ඒවායේ වසන බවට බොහෝ දෙනා දැක තිබේ.

ආහාර පිළියෙල කිරීම සඳහා ආපනශාලාව තුළ ප්‍රමාණවත් ඉඩක් නොමැති බැවින්, මෙම කෙටි ආහාර පිළියෙල කරනු ලබන්නේ ආපන ශාලාවෙන් පිටත විවෘත ස්ථානයක තබා ඇති මේසයක් මත ය.රුක්මාල්ගේ බිරිඳ වන සමන්මලී,උදෑසනම ඉතිරි වූ ආහාර බැද සකස් කරන අතර එවැනි ආහාර අලෙවි වූ පසු නැවුම් ආහාර ද්‍රව්‍ය පිළියෙළ කරයි. ඇය මේසය යට හිස් බිමෙහි එළවළු තබන අතර බැදපු සොසේජස් සහ මාළු වසා නැති භාජනයක තබා ගනියි. බළලුන් දෙදෙනෙකු ද ආපනශාලාව තුළ රැඳී සිටින අතර ඇතැම් විට මේසය යට එළවළු තබන ස්ථානයෙහි උන් නිදාගැනීමට පුරුදු වී ඇත. එසේම, ආපනශාලාව තුළ ශීතකරණයක් නොමැති නිසා බෝතල් කළ බීම ද භාණ්ඩ ප්‍රදර්ශනයට තබන අල්මාරියේ තබා ඇත. මෙම බෝතල් ලේබල් කර නොමැති අතර ඒවායේ ඉහළ සීනි ප්‍රමාණයක් අඩංගු බව කියනු ලැබේ. ලේබලයක් නොමැති බැවින් අඩංගු ද්‍රව්‍ය, කල් ඉකුත්වීමේ දිනය සහ නිෂ්පාදකයාගේ විස්තර වැනි තොරතුරු මහජනයාට ලබා ගත නොහැක. ආපන ශාලාවට ආසන්නව ඇති පාසලේ කසල වළෙන් ද ඇතැම් විට දුර්ගන්ධයක් වහනය වෙයි.

පාසලේ ගුරුවරයෙකු වන හුසේන්, රුක්මල්ට එරෙහිව කවර හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිද යන්න පිළිබඳව ඔබෙන් උපදෙස් විමසා සිටියි. 1980 අංක 26 දරන ආහාර පනතේ(සංශෝධිත) අදාළ විධිවිධාන හා ප්‍රායෝගික උදාහරණ ඇසුරෙන් හුසේන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

5. "ආර්ථික ලිහිල්කරණයේ මූලික අරමුණ වන්නේ පාරිභෝගික අවශ්‍යතා උපරිම ලෙස තෘප්තිමත් කිරීම සඳහා සම්පත් වෙන් කිරීමයි. මේ සම්බන්ධයෙන් පාරිභෝගික ආරක්ෂණ නීති වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. පාරිභෝගික ආරක්ෂණය යන්නට පාරිභෝගිකයාට පවතින විවිධ අයිතිවාසිකම් සහ විවිධාකාර පිළියම් ඇතුළත් වේ."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද?

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතුඅධිකාරිය පිළිබඳ පනතේ විධිවිධානවලට අදාළව ඉහත ප්‍රකාශයේ වලංගුභාවය විවේචනාත්මකව අගයන්න.

අදාළ නඩු තීන්දු සහ උදාහරණ ඇසුරෙන් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 20)

6. සංචාරක ඒජන්සියක කැබ් රථ රියදුරෙකු වන අමේෂ්, Alive රක්ෂණ සමාගමෙන් ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබාගෙන ඇත.

පහත දැක්වෙන්නේ අමේෂ් විසින් සම්පූර්ණ කරන ලද යෝජනාව පත්‍රයේ කොටසකි.

අ) ප්‍රශ්නය- ඔබ කවර හෝ විටකදී කවර හෝ අපරාධයකට වරදකරුවෙකු වී තිබේද?

පිළිතුර - නැත

ආ) ප්‍රශ්නය - පසුගිය වසර 5 තුළ ඔබ කිසියම් සැත්කමකට, අනතුරකට හෝ තුවාල වීමකට ලක්වී තිබේද?

පිළිතුර - නැත

අයදුම්පත පුරවන අතරවාරයේදී අමේෂ් අත්වැරදීමකින් ඔහුගේ වයස අවුරුදු 33 වෙනුවට 30 ලෙස සඳහන් කර තිබිණි. වයස අවුරුදු 19 දී නොසැලකිලිමත් ලෙස රිය ධාවනය සම්බන්ධයෙන් ඔහු වැරදිකරුවකු වී ඇති නමුත් එය වැදගත් යැයි ඔහු සිතුවේ නැත. එසේම, වයස අවුරුදු 10 දී ඔහුව ශල්‍යකර්මයකට භාජනය කර ඇති බවද අමේෂ් අනාවරණය කළේ නැත.තවද, යෝජනා පත්‍රයේ පහත දැක්වෙන වගන්තියට යටින් අමේෂ් අත්සන් තබා ඇත.

*"මගේ උපරිම දැනීමට සහ විශ්වාසයට අනුව, යෝජනා පත්‍රයේ අඩංගු සියලුම ප්‍රකාශ සහ විස්තර සත්‍ය සහ සම්පූර්ණ වන බවත්, කිසිදු වැදගත් කරුණක් සැඟවීමක් හෝ යටපත් කිරීමක් කර නොමැති බවත් මම ප්‍රකාශකරමි."*

රක්ෂණ ඔප්පුව ලැබීමෙන් මාස තුනකට පසු ඔහු තම කැබ් රථය වෑන්රථයකට මාරු කර එම සංචාරක සමාගමෙහිම සේවය කළේය. කෙසේවෙතත්, ඔහු එය Alive රක්ෂණ සමාගමට දැනුම් දුන්නේ නැත. දින කිහිපයකට පසු, ඔහුගේ වෑන් රථය බස් රථයක ගැටීම නිසා අමේෂ් සදාකාලික ආබාධිත තත්වයට පත් වූවේය. අමේෂ් රක්ෂණ ගිවිසුම උල්ලංඝනය කර ඇතැයි දක්වමින් Alive රක්ෂණ සමාගම ඔහුගේ රක්ෂණ ඔප්පුව යටතේ ඉල්ලා සිටින ලද මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කරයි.

රක්ෂණ නීතිය අදාළ කර ගනිමින් අමේෂ්ට උපදෙස් දෙන්න.

අදාළ නීති මූලධර්ම සහ නඩු තීන්දු අදාළ කර ගනිමින් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 20)

7. "බිල්පතක වන අත්‍යවශ්‍ය ගුණාංගය වන්නේ එය ගනුදෙනු කළ හැකි වීම යි. එසේ වුවත්, කූට ලේඛන සැකසීමට එරෙහිව ආරක්ෂණ ක්‍රමයක් ලෙස අණකරු, බිල්පත පැවරීම හෝ ගනුදෙනු කිරීම සඳහා ඉඩ ලබා නොදීමට අපේක්ෂා කළ හැකිය. එසේම, පිටසන්ලාභියකු විසින් ඔහුගේ පිටසන ඔස්සේ තවත් පැවරීම් තහනම් කිරීමට කැමති විය හැකිය. ඒ අනුව, අණකරුට හෝ පිටසන්ලාභියාට සීමාකාරී වචන බිල්පතේ මුහුණතට ඇතුළත් කළ හැකි වේ"

Davis I.(1992)*Text Book on Commerical Law*(1st Ed)p196

බිල්පතක ගනුදෙනු කළ හැකි බව අදාළ කර ගනිමින් ඉහත ප්‍රකාශය සම්බන්ධයෙන් අදහස් දක්වන්න. විනිමය බිල්පත් ආඥා පනතේ අදාළ ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරෙන් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 20)

8. වාණිජ නීතියේ සන්දර්භය යටතේ පහත සඳහන් **ඕනෑම දෙකක(02)** වැදගත්කම පැහැදිලි කරන්න.

අ) *Nemo dat quod non habet* මූලධර්මය සහ ඊහි ව්‍යතිරේක

ආ) කොන්දේසි සහිත විකුණුම් ගිවිසුම (conditional sale agreement) සහ කුලී සින්නක්කර ගිවිසුම

ඇ) රක්ෂණ ගිවිසුමේ ස්වභාවය සහ අදාළත්වය

ඈ) භාණ්ඩ විකිණීම යටතේ අවදානම මාරු වීම

(ලකුණු 20)

***හිමිකම් ඇවිරිණි***